# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## හත්වන පාඩම
## අපි ගැන අපි සොයමු

### ඓතිහාසික කතා තත්කාලීන පරිසරය සමග ගළපයි

අහසින් අවුත් මිණිඅක් නයිඳු යැදුමට
රහතන් මැදෙහි මුනි හිඳ මිණි පලග පිට
දහමුත් දෙසු තැන කළ සැටරියන් කොට
මහ දාගැබ් සෙමින් වඩු සොළොස තැන් සිට

(කැලණි වෙහෙර ඉදි වූ ආකාරය පිළිබඳ ඉතිහාස කතා පුවත)

- ලෝකයේ ඉතාම ජනප්‍රිය චිත්‍රපට, ටෙලි කතා මාලා, වේදිකා නාට්‍ය ගත් කල ඓතිහාසික කතා පදනම්කරගත් නිර්මාණ බොහෝමයක් දැකිය හැකි ය. එම කතා අතීතයේ යුගයක සිදුවූ රසවත් කතාවක් පමණක් නොව අදට ගැලපෙන අන්දමට (තත්කාලීන පරිසරය සමග) යම් සමාජ පණිවුඩයක් නැතහොත් නූතන සමාජයට පාඩමක් ලෙස ඉදිරිපත් කර ඇති බව පෙනී යයි
  - උදා : - ධර්මාශෝක, ජෝධා අග්බර්, ග්ලැඩියේටර්, මේරි මැග්ඩලන්, මොහන්ජාදාරෝ

- ඓතිහාසික කතා ආශ්‍රය කරගෙන නිර්මාණය වූ ජනශ්‍රැති බොහෝමයක් පවතී. එමගින් ජන සංස්කෘතිය පෝෂණය වී ඇති ආකාරය අපට දැකිය හැකි ය. උදාහරණ ලෙස කුවේණි සම්බන්ධ කතා පුවත මුල් කරගෙන ඇතැම් ග්‍රාම නාම පවා නිර්මාණය වී ඇති අතර කුවේණි කතාවට අනුරූපීව ජනප්‍රවාදයන් ද පවතී. (කුවේණි අස්න එය මුල්කරගෙන බිහි වූ ඉතා වැදගත් සාහිත්‍යාංගයකි).
- ඓතිහාසික කතා මගින් විවිධ චරිත හඳුනාගත හැකි අතර, එවැනි නිර්මාණ ද රැසක් පවතී. වීර පුරන් අප්පු, සරදියෙල් වැනි වීර චරිත මෙන් ම කුසුමාසන දේවිය, ගජමන් නෝනා වැනි චරිත පදනම් කරගත් කතා අපට හමු වේ. නාට්‍යමය වශයෙන් ඉතා හොඳ තේමා එමගින් සැපයාගත හැකි ය.

- පරිකල්පනය හා නිර්මාණශීලී චින්තනය යොදා ගනිමින් අපූර්වත්වයෙන් යුත් නිර්මාණ ඉතිහාස කතා ඔසසේ බිහි කළ හැකි ය. එමෙන් ම ඉතිහාසය ඉගැන්වීම සඳහා උචිත ක්‍රමෝපායක් වශයෙන් ද නාට්‍යය යොදා ගනියි

### අභ්‍යාස

ක්‍රියාකාරකම :

- කණ්ඩායමක් ලෙස එක් වී එක් ඉතිහාස කතාවක් තෝරාගෙන ඒ පිළිබඳ ව සාකච්චා කරන්න
- ඉතිහාස කතාවල ඇති නාට්‍යෝචිත අවස්ථා හඳුනාගෙන පරිකල්පන ශක්තිය මෙහෙයවා, උචිත බස් වහරක් යොදා ගනිමින්, සංවාද ගොඩනගන්න.
- එයට අවශ්‍ය රංග විධාන සහිත ව නාට්‍ය පෙළක් සේ සකස් කරන්න
- පෙළ ආකාරයට චරිත සඳහා උචිත වන ලෙස වේෂභූෂණ යොදාගන්නා ආකාරය පිළිබඳ ව සාකච්චා කරන්න
- පෙළට අදාල නාට්‍යෝපකරණ සාදාගැනීම සඳහා සැලැස්මක් සකස් කරන්න.

එන් එල් දිල්ෂාන් ලියනගේ - රත්මලවින්න මහා විද්‍යාලය